සැ.යු.: 2025.07.18 දින පළ කරන ලද අංක 2446 ගැසට් පත්‍රයේ IV අ කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,447 - 2025 ජූලි මස 25 වැනි සිකුරාදා - 2025.07.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


පිටුව

ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් :
- ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... —
- අවසාන නියෝග .... ... ... ... —
- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... —
- ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම :
- බස්නාහිර පළාත .... ... ... ... —
- මධ්‍යම පළාත .... ... ... ... —
- දකුණු පළාත .... ... ... ... —
- උතුරු පළාත .... ... ... ... —
- නැගෙනහිර පළාත .... ... ... ... —
- වයඹ පළාත .... ... ... ... —
- උතුරු මැද පළාත .... ... ... ... —
- ඌව පළාත .... ... ... ... —
- සබරගමුව පළාත .... ... ... ... —

පිටුව

ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරී විසින් ඉඩම් විකිණීම :
- බස්නාහිර පළාත .... ... ... ... —
- මධ්‍යම පළාත .... ... ... ... —
- දකුණු පළාත .... ... ... ... —
- උතුරු පළාත .... ... ... ... —
- නැගෙනහිර පළාත .... ... ... ... —
- වයඹ පළාත .... ... ... ... —
- උතුරු මැද පළාත .... ... ... ... —
- ඌව පළාත .... ... ... ... —
- සබරගමුව පළාත .... ... ... ... —
- ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... —
- ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... 262
- ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... —
- ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... —
- ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... 265


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළ කිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තතු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 අගෝස්තු මස 15 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 අගෝස්තු මස 01 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2025 ජුනි මස 09 වැනි දින ,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාත් සභාවේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) එච්. කේ. සාගරිකා දිල්හානි වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1998.10.29 වැනි දින ප්‍රදානය කර ඇති අංක මධ්‍යම/පාහේ/1559 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන මයිලගස්යාය ජනපදයේ පදිංචි හිරිමුරේගේ මිල්රව් වෙත ප්‍රදානය කොට මහනුවර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO/G06/131/99 යටතේ 1999.03.03 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.15 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හේවාවිස්ස කෝරළේ උඩමයිලපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මයිලගස්යාය ජනපදය නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 61/5/2 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි සම්පාදිත මහ/වි/කු/89/04 දරන අංක 34 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් පර්චස් 20 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම මයිලගස්යාය ජනපදය

*උතුරට* : ජනපද පාර,
*නැගෙනහිරට* : කට්ටි අංක 33,
*දකුණට* : ජනපද පාර,
*බස්නාහිරට* : කට්ටි අංක 35

එච්. කේ. සාගරිකා දිල්හානි,
ප්‍රාදේශීය ලේකම්,
පාතහේවාහැට - තලාතුඔය

2024 මැයි මස 13 වැනි දින.

07 - 759/1

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාත් සභාවේ, මහනුවර දිස්ත්‍රික්කයේ, දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් රත්නායක මුදියන්සේලාගේ ශමීර නුවන් රත්නායක වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1994.11.07 වැනි දින ප්‍රදානය කර ඇති අංක මධ්‍යම/පාහේ/681 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන උඩදෙල්තොට පදිංචි බෙරකාර ගෙදර අගෝරිස් වෙත ප්‍රදානය කොට මහනුවර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO/G02/151/95 යටතේ 1995.03.10 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.15 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගංදහය දකුණ කෝරළේ පාළුගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, උඩදෙල්තොට නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේයර් ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 1 25/63 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක මු. පි. මහ. 728 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 19 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් රූඩ් 01 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : බෙල්වුඩ් වත්ත

*උතුරට* : කට්ටි අංක 15 තලාතුඔය සිට ගලහ දක්වා එන ප්‍රධාන පාර සහ කට්ටි අංක 20,
*නැගෙනහිරට* : කට්ටි අංක 15 තලාතුඔය සිට ගලහ දක්වා එන මාර්ග රක්ෂිතය සහ කට්ටි අංක 18,
*දකුණට* : කට්ටි අංක 18 බෙල්වුඩ් වත්ත,
*බස්නාහිරට* : කට්ටි අංක 20 සහ බෙල්වුඩ් වත්ත.

ආර්. එම්. එස්. එන්. රත්නායක,
ප්‍රාදේශීය ලේකම්,
දෙල්තොට.

2025 ජනවාරි මස 22 වැනි දින.

07 - 759/2

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

#### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාත් සභාවේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් අත්මා දිලුක්ෂි ජයරත්න වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1992.07.20 වැනි දින ප්‍රදානය කර ඇති අංක මධ්‍යම/මහ/උප/42 ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන නව රොක්ස්වයිල් ජනපදයේ, පදිංචි මහ විදානලාගේ දොන් සුමතිරත්න වෙත ප්‍රදානය කොට ගම්පොල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. සී. 7/184 යටතේ 1992.09.14 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.15 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ, උඩ පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඳුකර ඉහළ පත්තුව/කෝරළේ පුස්සැල්ලාව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පුස්සැල්ලාව ඉහළගම නමැති ගමේ පිහිටා ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත පි. පි. මහ 3311 දරන පිඹුරෙහි අංක 31 දරන බිම් කැබැල්ල ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.189 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : නව රොක්ස්වයිල් ජනපදය.

*උතුරට* : කට්ටි අංක 29,
*නැගෙනහිරට* : කට්ටි අංක 30,
*දකුණට* : කට්ටි අංක 32,
*බස්නාහිරට* : කට්ටි අංක 28.

අත්මා දිල්රුක්ෂි ජයරත්න,
ප්‍රාදේශීය ලේකම්,
උඩපළාත,
ගම්පොළ.

2024 සැප්තැම්බර් මස 30 වැනි දින.

07 - 759/3

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

#### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාත් සභාවේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් සන්ධ්‍යා මද්දුමදේවි චන්ද්‍රෙස්කර ගුණරත්න වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ හිටපු අතිගරු ජනාධිපති විසින් 1995 නොවැම්බර් මස 08 වැනි දින ප්‍රදානය කර ඇති අංක මධ්‍යම/යනු/753 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අලගල්ල ජනපදයේ පදිංචි බුළුගම්මන ගෙදර මුතුබණ්ඩා වෙත ප්‍රදානය කොට මහනුවර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO/B/03/131/95 යටතේ 1995.11.16 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටි ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.15 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ, යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඳු පළාත කෝරළේ, අලගල්ල ඉහළ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ගොඩිගමුව නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, යටිනුවර ප්‍රාදේශීය ලේකම් භාරයේ ඇති සහ රජයේ මිනින්දෝරු විසින් සම්පාදිත අංක මූ . පි. මහ. 3539 පිඹුරේ අංක 16 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.101 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම,

*උතුරට* : කැබලි අංක 15,
*නැගෙනහිරට* : කැබලි අංක 17 සහ 61,
*දකුණට* : කැබලි අංක 62 සහ 2,
*බස්නාහිරට* : කැබලි අංක 2.

එස්.එම්. සී. ගුණරත්න,
ප්‍රාදේශීය ලේකම්,
යටිනුවර.

2024 නොවැම්බර් මස 21 වැනි දින.

07 - 759/4

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාත් සභාවේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ජේ. එම්. රම්‍යා ජයසුන්දර වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1986.01.28 වැනි දින ප්‍රදානය කර ඇති අංක මහ/ප්‍ර/5649 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන ඉඟුරුඔය ජනපදයේ පදිංචි උක්දඩුගොඩේ ගෙදර බබානිස් වෙත ප්‍රදානය කොට ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටි ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.15 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පස්බාගේ කෝරළයේ, මාපාකන්ද ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දෙකිඳ නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, අංක පීපී ඒ 267 දරන රේඛා සටහනේ අංක 51 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් අක්කර 01, පර්චස් 24 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම ඉඟුරු ඔය ජනපදය

| | |
|---|---|
| *උතුරට* | : ඇල රක්ෂිතය, |
| *නැගෙනහිරට* | : කට්ටි අංක 50, |
| *දකුණට* | : කට්ටි අංක 56, |
| *බස්නාහිරට* | : කට්ටි අංක 52. |

ජේ. එම්. රම්‍යා ජයසුන්දර,
ප්‍රාදේශීය ලේකම්,
පස්බාගේ කෝරළේ.

2024 ඔක්තෝබර් මස 31 වැනි දින.

07 - 759/5

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඩබ්ලිව්. තිළිණි නිසංසලා සිල්වා වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ ජනාධිපති විසින් 1986 වර්ෂයේ දී ප්‍රදානයකර ඇති අංක එල්. එස්. කු. 199 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන ගනේවත්ත පාර, වාරියපොල, හොරොම්බුව හි පදිංචි ෆීලික්ස් නිවුටන් ද සිල්වා වෙත ප්‍රදානය කොට කුරුණෑගල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. /07/14 යටතේ 1986.05.29 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩම, දීමනාපත්‍රයේ කොන්දේසි උල්ලංඝනය වන පරිදි අන්සතු කර ඇති බැවින්, එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.15 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

වයඹ පළාතේ,කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ, කොබෙයිගනේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ, බලදොර කෝරළයේ, වලස්වැව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වලස්වැව නමැති ගමේ පිහිටා ඇති සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලැබ ඔහු භාරයේ ඇති අංක 1629 දරන අවසාන ගම් පිඹුරු අංක 121 හා 128 දරන බිම් කැබලි වශයෙන් නිරූපණය කර ඇති ප්‍රමාණයෙන් අක්කර 13, පර්චස් 23 ක් ඇතැයි ගණන් බලා තිබෙන හැලඹවැවහේන, දන්ගහමුලහේන්යාය යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය.

| | |
|---|---|
| *උතුරට* | : බිම් කට්ටි 120, |
| *නැගෙනහිරට* | : තිඹිරිවැව ගම් සීමාව, |
| *දකුණට* | : තිඹිරිවැව ගම්මායිම සහ කරත්ත පාර දිගේ වෙන්කළ රක්ෂිත බිම, |
| *බස්නාහිරට* | : කරත්ත පාර දිගේ වෙන්කළ රක්ෂිත බිම සහ කපුගම ගම් මායිම (පාර සහ පාරවල් සඳහා වෙන් කළ රක්ෂිත බිම් හා බිම් කට්ටි අංක 125 ඇතුළත් නොවිය යුතුය. |

ඩබ්ලිව්. තිළිණි නිසංසලා සිල්වා,
ප්‍රාදේශීය ලේකම්,
කොබෙයිගනේ.

2025 මාර්තු මස 07 වැනි දින,

07 - 826

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාත් සභාවේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් එස්. එම්. පී. නන්දසේන වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1963.08.06 වැනි දින ප්‍රදානය කර ඇති අංක ආර් 7077 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අංක 07, රජයේ බංගලාව, පේරාදෙණිය පදිංචි එල්. ඊ. ඒ. ෆොන්සේකා වෙත ප්‍රදානය කොට පුත්තලම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක ආර් 7077 යටතේ 1963.08.23 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටි ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.15 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

පුත්තලම පරිපාලන දිස්ත්‍රික්කයේ, වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පොම්පරිප්පු පත්තුවේ, වනාතවිල්ලුව උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වනාතවිල්ලුව නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, පුත්තලම මිනුම් අධිකාරී භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක පී. පී. ඒ. 1710 දරන පිඹුරේ අංක 89 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් අක්කර 26, පර්චස් 38 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

*උතුරට* : කැබලි අංක 88,
*නැගෙනහිරට* : කැබලි අංක 62 ප්‍රධාන මාර්ග රක්ෂිතය,
*දකුණට* : කැබලි අංක 90 ප්‍රාදේශීය සභා මාර්ගය,
*බස්නාහිරට* : කැබලි අංක 86.

එස්. එම්. පී. නන්දසේන,
ප්‍රාදේශීය ලේකම්,
වනාතවිල්ලුව.

2025 මැයි මස 13 වැනි දින,
වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී.

07 - 827

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/76892.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :* NWP/PLC/L10/MK/LTL/45.

**21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මහකුඹුක්කඩවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 612/ඩී පුනවිටිය ග්‍රාම නිලධාරි වසමේ, පුනවිටිය ගමේ ජනපද නිලධාරී විසින් අඳින ලද දළ සැලැස්මේ අංක 2023/05 හි කැබලි 01 අනුව ප්‍රමාණයෙන් අක් : 22, රූඩ් : 01, පර් : 10 ක් වූ රජයේ ඉඩම් කොටස, සත්ත්ව පාලන හා කෘෂිකාර්මික කටයුත්තක් සඳහා දීර්ඝකාලීන බද්දක් මත ලබාදෙන ලෙස කසදෝරුගේ ඉරේෂ් ශානක පෙරේරා මයා විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත දැක්වේ:

*උතුරට* : අ. ග. පි. 3168 (පාඩියාමනුව කොටසක්), අ. භූ. පි. 28 කැ. අ. 2167, 2157,
*නැගෙනහිරට* : අ. භූ. පි. 28 කැබලි අංක 2167,
*දකුණට* : අ.භූ.පි. 28 කැබලි අංක 2167, 1769, 1918, 1917, 1896,
*බටහිරට* : අ. ග. පි. 3168 (පාඩියාමනුව කොටසක්), අ. භූ. පි. 28 හි කැබලි අංක 1824 2/2, 1751, 1752, 1753, 1766, 1770, 1769, 1917, 1896

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:

(අ) *බදු කාලය.* - අවුරුදු තිහයි (30) (2025.05.20 දින සිට 2055.05.19 දින දක්වා);

*වාර්ෂික බදු මුදල* .- 2025 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2% කි. 2025 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහ (රු. 5,000,000) හෝ මිලියන පහට

(රු. 5,000,000.00) හෝ මිලියන පහට වඩා වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

වාර මුදල : වාර මුදලක් අය නොකෙරේ.

*(ඇ)* මෙම ඉඩම කෘෂිකාර්මික කටයුතු සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය;

*(ඈ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/ ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතු ය;

*(ඉ)* පළාත් ඉඩම් කොමසාරිස්/ නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්, ප්‍රාදේශීය ලේකම්, ව්‍යාපෘතියට අදාළ ආයතන හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

*(ඊ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(ඌ)* 2025.05.20 දින සිට වසර 05 ක් ගත වන තුරු බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු සහ පැවරීම් හැර වෙනත් අතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ;

*(එ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත; බදුගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවකදී ගෙවිය යුතු හිඟබදු සඳහා 10% ක දඩ පොළියක් අය කරනු ලැබේ.

මෙම නිවේදනය පළ වූ දින සිට සති 06 ක් ඇතුළතදී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

තුසිත ගලප්පත්ති,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2025 ජූලි මස 07 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

07 - 758

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/17523.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :* එන්සීපී/පීඑල්සී/එල්02/ මනුප/-2024 ii.

**21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

අනුරාධපුරය දිස්ත්‍රික්කයේ, මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 290 පුසියන්කුලම ග්‍රාම නිලධාරී වසමේ, ඉලුප්පුකුලම ගමේ ඉඩම් නිලධාරී විසින් සකස් කරන ලද දළ අනුරේඛනයේ කැබලි අංක 01 න් දැක්වෙන ප්‍රමාණයෙන් අක්කර 11 පර්චස් 29 ක් වූ රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා දොන් ආනන්ද පනාපිටිය මයා නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

01. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ:

| | |
|---|---|
| *උතුරට* | : ඒ. ඒ. ඩී. ශ්‍රියා කාන්තිගේ ඉඩම හා ජී. ඩබ්. ඒ. රත්නසිරිගේ ඉඩම, |
| *නැගෙනහිරට* | : රජයේ ඉඩම, |
| *දකුණට* | : වීරකෝන් බංඩාගේ ඉඩම, එස්. කුමාරිගේ ඉඩම, එම්. කුමාරිහාමිගේ ඉඩම, |
| *බටහිරට* | : මාර්ග රක්ෂිතය. |

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:

*(අ) බදු කාලය.* - අවුරුදු තිහයි (30) (2025.04.10 දින සිට 2055.04.09 දක්වා);

*(ආ) වාර්ෂික බදු මුදල* .- 2025 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2% කි. 2025 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහ (රු. 5,000,000) හෝ ඊට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

වාර මුදල : වාර මුදලක් අය නොකෙරේ;

*(ඈ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.;

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය;

*(ඉ)* ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

*(ඊ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(ඌ)* 2025.04.10 දින සිට අවුරුදු 05 ක කාලක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ;

*(එ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදුගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවකදී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10% ක දඩ පොළියක් අය කරනු ලැබේ.

*ගැසට්* පත්‍රයේ පළ කළ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

තුසිත ගලප්පත්ති,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2025 ජූලි මස 07 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

07 - 803

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/77197.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :* PLC/L3/29/07/02-2024.

### 21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 730 ඒ, කලපුව ග්‍රාම නිලධාරි වසමේ, කටුකුරුන්ද ගමේ අනුරේඛන අංක Ka/KAL/2020/48 කැබලි අංක A වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0152 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් වාණිජ කටයුතු සඳහා බද්දේ ලියනරාලලාගේ දොන් පීලික්ස් නිහාල් විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

*උතුරට* : මුහුදු වෙරළ,
*නැගෙනහිරට* : මාර්ගය,
*දකුණට* : මුහුදු වෙරළ,
*බටහිරට* : මුහුදු වෙරළ

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:

*(අ)* *බදු කාලය.* - අවුරුදු තිහයි (30) (2024.12.30 දින සිට 2054.12.29 දක්වා);

*(ආ)* *වාර්ෂික බදු මුදල .*- 2024 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2% කි. 2024 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

වාර මුදල : නැත.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය;

*(ඈ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.;

*(ඉ)* ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

*(ඊ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(ඌ)* බද්ද ක්‍රියාත්මක වන 2024.12.30 දින සිට අවුරුදු 05 ක අවම කාලක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ;

*(එ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත;

මෙම නිවේදනය පළ වූ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම්. සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2025 ජූලි මස 07 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

07 - 823

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/76110.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :* සීපීසී/එල්සී/එල්ඩී/4/1/28/222.

**21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

මාතලේ දිස්ත්‍රික්කයේ, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් බුලනවැව ඊ 437 ඒ ග්‍රාම නිලධාරි වසමේ බුලනවැව ගමේ අ. ග. පි. 356 හි කැබලි අංක 16 න් කොටසක් දැක්වීම සඳහා ග්‍රාම නිලධාරි විසින් අඳින ලද දළ අනුරේඛනයේ දැක්වෙන ප්‍රමාණයෙන් පර්චස් 35 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් සමිති කටයුතු සඳහා සී/ස ගලේවෙල විවිධ සේවා සමුපකාර සමිතිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

| | |
|---|---|
| *උතුරට* | : රජයේ ඉඩම, |
| *නැගෙනහිරට* | : ජනපද පාර රක්ෂිතය, |
| *දකුණට* | : ජනපද පාර රක්ෂිතය, |
| *බටහිරට* | : කුණු ඇළ. |

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:

*(අ)* *බදු කාලය.* - අවුරුදු තිහයි (30) (2025.05.23 දින සිට 2055.05.22 දක්වා);

*(ආ)* *වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත ගරු ඇමතිතුමා බදු අනුමත කළ 2025 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2% කි.

වාර මුදල : නැත.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම සමිති කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය;

*(ඈ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.;

*(ඉ)* ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

*(ඊ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(ඌ)* බද්ද ක්‍රියාත්මක වන 2025.05.23 දින සිට වසර 05 ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ;

*(එ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත;

මෙම නිවේදනය පළ වූ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන්

ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

කේ. පී. ජී. සෞම්‍යා,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2025 ජූලි මස 07 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

07 - 824

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/76972.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :* සීපීසී/එල්සී/එල්ඩී/4/1/28/222.

**21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

මාතලේ දිස්ත්‍රික්කයේ, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් දඹුබැදිරුප්ප ඊ 438 ඒ ග්‍රාම නිලධාරි වසමේ දඹුබැදිරුප්ප ගමේ අ. ග. පි. 399 හි කැබලි අංක 586 න් දැක්වෙන ප්‍රමාණයෙන් රූඩ් 01, පර්චස් 15 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් සමිති කටයුතු සඳහා සී/ස ගලේවෙල විවිධ සේවා සමුපකාර සමිතිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

*උතුරට* : කැබලි අංක 73, 585, 587,
*නැගෙනහිරට* : කැබලි අංක 585, 587, 588,
*දකුණට* : කැබලි අංක 588, 73,
*බටහිරට* : කැබලි අංක 73.

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:

*(අ)* *බදු කාලය.* - අවුරුදු තිහයි (30) (2025.05.23 දින සිට 2055.05.22 දක්වා);

*(ආ)* *වාර්ෂික බදු මුදල .*- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත ගරු ඇමතිතුමා බදු අනුමත කළ 2025 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2% කි.

වාර මුදල : නැත.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම සමුපකාර සමිති කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය;

*(ඈ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.;

*(ඉ)* ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

*(ඊ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(ඌ)* බද්ද ක්‍රියාත්මක වන 2025.05.23 දින සිට වසර 05 ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ;

*(එ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත;

මෙම නිවේදනය පළ වූ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

කේ. පී. ජී. සෞම්‍යා,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2025 ජූලි මස 07 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

07 - 825

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/77278.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :* අම්/ඉකො/සද්/වාණි/59.

### 21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

අම්පාර දිස්ත්‍රික්කයේ, අම්පාර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ W/89/F, සද්ධාතිස්සපුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, සද්ධාතිස්සපුර ගමේ අංක මූ. පී. අම්. 1406 දරන පිඹුරේ කැබලි අංක 6 න් කොටසක් පෙන්වීමට රජයේ ලියාපදිංචි බලයලත් මිනින්දෝරු විසින් සකසන ලද අංක 1471/485 දරන පිඹුරේ කැබලි අංක A හි දැක්වෙන ප්‍රමාණයෙන් පර්චස් 06 ක් වූ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා මාජී ප්‍රියංගා ඉහලගෙදර නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

| | |
|---|---|
| *උතුරට* | : පී. පී. අම්. 1406 කැබලි අංක 06 ඉතිරි කොටස හා කැබලි අංක 05, |
| *නැගෙනහිරට* | : පී. පී. අම්. 1406 කැබලි අංක 05 සහ කැබලි අංක 07, |
| *දකුණට* | : පී. පී. අම්. 1406 කැබලි අංක 07 සහ කැ. සි. 280002 හි කැබලි අංක 245, |
| *බටහිරට* | : කැ. සි. 280002 හි කැබලි අංක 245 සහ පී. පී. අම්. 1406 කැබලි අංක 06 හි ඉතිරි කොටස; |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:

*(අ)* *බදු කාලය.* - අවුරුදු තිහයි (30) (2025.05.28 දින සිට වසර 30 ක් ඉදිරියට);

*වාර්ෂික බදු මුදල* .- 2025 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන වන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2% කි. 2025 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහ (රු. 5,000,000) හෝ රුපියල් මිලියන පහට (රු. 5,000,000) වඩා වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.;

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඈ)* පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(උ)* 2025.05.28 දින සිට වසර පහක් ගතවන තුරු අතුරු බදුදීම් හෝ පැවරීම සඳහා අවසර දෙනු නොලැබේ;

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවකදී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10% ක දඩ පොළියක් අය කරනු ලැබේ.

*ගැසට්* නිවේදනය පළ වූ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

ආර්. ඩී. එල්. චමිඳු ලක්ෂාන් ජයරත්න,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2025 ජූලි මස 19 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

07 - 828

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.